# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල



| | | | |
|---|---|---|---|
| දිනය Date | 2025.11.26 පැය 2000 | | |
| දුරකථන අංකය Tel.NO | 011-2887973 | | |
| මගේ අංකය My NO | D/Media/Out/2113/2025 | | |
| විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk | | |


**01. ආපදා තත්ත්වයක් හේතුවෙන් මාර්ග අවහිරතාවයක් - කොත්මලේ පොලිස් වසම.**

2025.11.26 වන අද දින කොත්මලේ පොලිස් වසමේ පවතින අධික වැසි සහිත කාළගුණික තත්ත්වය හේතුවෙන් නුවරඑළිය මහනුවර ප්‍රධාන මාර්ගයේ ගැරඩිඇල්ල ප්‍රදේශයේ ඉහළ බෑවුමේ විශාල ගලක් බුරුල් වී මාර්ගය දෙසට ලිස්සා පෙරළීමේ අවධානමක් මතුවීම හේතුවෙන් ඉහත මාර්ගය ගැරඩිඇල්ල ප්‍රදේශයෙන් තාවකාලිකව වසා දැමීමට කටයුතු කර ඇත.

ඉහත මාර්ගයේ ගමන්ගන්නා රියදුරන්ට නුවරඑළිය දෙසට හා මහනුවර දෙසට ගමන් කිරීමට තවලන්මිතැන්න හන්දියෙන් නව නගරය දෙසට ගමන් කර රම්බොඩගම හරහා රම්බොඩ උමඟ අසලට දිවෙන මාර්ගය විකල්ප මාර්ගයක් වශයෙන් භාවිතා කළ හැක.

**02. ආපදා තත්ත්වයක් හේතුවෙන් මාර්ග අවහිරතාවයක් - අම්පාර පොලිස් වසම.**

2025.11.26 වන අද දින අම්පාර පොලිස් වසමේ පවතින අධික වැසි සහිත කාළගුණික තත්ත්වය හේතුවෙන් අම්පාර ඉගිනියාගල මාර්ගය ආසන්න ඇති කොණ්ඩුවටුවාන වැවේ පිටවාන ඔස්සේ ජලය පිටාර ගැලීම හේතුවෙන් මාර්ගය ජලයෙන් යට වී රථවාහන ගමනාගමනයට බාධා එල්ල වී ඇත. එබැවින් 2025.11.26 වන අද දින පැය 1800 සිට එම මාර්ගයේ ගමනාගමනය සඳහා තාවකාලිකව වසා තබා ඇත.

ඉහත මාර්ගය හරහා ගමන්ගන්නා රියදුරන්ට විකල්ප මාර්ග භාවිතා කරන ලෙසට පොලිසිය ඉල්ලා සිටී.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**